# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
# තේ පර්යේෂණ සභාව

## වතු අධිකාරී තනතුර (කොන්ත්‍රාත් පදනම මත)

## ශාන්ත කූම්බ්ස් වතුයාය, තලවකැලේ

ඉහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

තලවකැලේ පිහිටි ශාන්ත කූම්බ්ස් වතුයාය සහ කර්මාන්තශාලාව භාරව උසස් ලෙස සුදුසුකම්ලද විද්‍යාඥයන් කණ්ඩායමක් සහිත පරිසරයක කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය විසින් කාර්යශූර වැවිලිකරුවකු සොයයි. මෙම තනතුර, තේ පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයන් සමග කටයුතු කරමින් තේ කර්මාන්තයේ පිළිගැනීමක් ලබාගනිමින් ස්වකීය වෘත්තීය කටයුතු වැඩිදියුණු කර ගැනීම සඳහා සුදුසු පරිදි සුදුසුකම් ලබා ඇති අයෙකුට කදිම අවස්ථාවකි.

**රැකියා විස්තරය**

තේ වතුයාය සහ කාර්යාලය තේ කර්මාන්තශාලා කළමනාකරණය කිරීමේ සියලුම කටයුතු සැලසුම් කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් වගකීම දැරීම සහ කළමනාකාරීත්වයට උපචිත තොරතුරු ලබාදීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී සිංහල/ දෙමළ භාෂාව, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව සම්මාන හතරක් (4) සමග එක්වර විෂයන් හයකින් (6) සමත් වී තිබීම.

සහ

අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විෂයන් තුනකින් (03) (සාමාන්‍ය පොදු ප්‍රශ්නපත්‍රය හැර) සමත් වී තිබීම.

හෝ

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 05 මට්ටමට (NVQ Level 05) නොඅඩු වැවිලි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

කඳුරට තේ වතුයායේ සහ කර්මාන්තශාලාව වතු අධිකාරී ලෙස වැවිලිකරුවෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් අපේක්ෂක සතුව තිබිය යුතු අතර, තේ කොළ මිලදී ගන්නා තේ කර්මාන්තශාලාවක මෙහෙයුම් පිළිබඳ පළපුරුද්ද ද අවශ්‍යවේ.

විශිෂ්ට අන්තර් පුද්ගල සම්බන්ධතා, කණ්ඩායම් හැඟීම සහ ජාලගතකිරීමේ නිපුණතා අමතර සුදුසුකම් ලෙස සලකනු ලැබේ.

සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීමේ දැනුම සහ දෙමළ භාෂාව කථා කිරීමේ හැකියාව ඉතා වැදගත් වේ.

මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත වන අතර, මූලික වසර 03 ක් සඳහා වාර්ෂිකව අලුත් කිරීමේ පදනම මත වේ.

**වැටුප :**

දළ වශයෙන් රු. 125,000/- ක පමණ සියලුදේ ඇතුළත් මාසික වැටුප් පැකේජයක් ගෙවනු ලැබේ.

තෝරාගනු ලබන අපේක්ෂකයාට තේ පර්යේෂණ ආයතනය විසින් නියම කරන ලද පරිදි මෙම තනතුරට අදාළ අමතර පහසුකම් ලබා දෙනු ලැබේ.

සම්පූර්ණ ජීව දත්ත ඇතුළත් අයදුම්පත උප්පැන්න සහතිකයේ පිටපතක්, අදාළ අධ්‍යාපන හා අනෙකුත් වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත්, සේවා සහතික හා අදාළ ක්ෂේත්‍රයේ අයදුම්කරුගේ නිපුණතා හා දැනුම තක්සේරු කළ හැකි ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග 2020 සැප්තැම්බර් 21 වෙනි දින හෝ ඊට පෙර පහත සඳහන් අය වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

රාජ්‍ය සේවයේ/ සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බ්ස්, තලවකැලේ.**